# පුරප්පාඩු

## කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම් ලත් පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ සිවිල් ඉංජිනේරු** - (PS 3) - (කොන්ත්‍රාත් පරිපාලනය) | 01 | (පහත 01 හෝ 02 හෝ 03)<br><br>(1) අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ උපාධියට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් හෝ ආශ්‍රිත සාමාජිකත්වය / අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් සමඟ සුදුසුකම් ලබාගැනීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 14ක පළපුරුද්ද.<br><br>(2) අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ උපාධියට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් හෝ ආශ්‍රිත සාමාජිකත්වය/අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්, ආයතනික/වරලත් සාමාජිකත්වය හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක් සමඟ සුදුසුකම් ලබාගැනීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක පළපුරුද්ද.<br><br>(3) රජයේ දීප ව්‍යාප්ත සේවාවක I පන්තියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්ත්වයක් සහ I පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.<br><br>***- සමාන ක්ෂේත්‍රයක පළපුරුද්ද ඇති අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.*** |

| | | |
|---|---|---|
| **යාන්ත්‍රික ඉංජිනේරු** - (PS 4) (අපද්‍රව්‍ය ප්‍රවාහනය සහ ගොඩකිරීම)<br>A කාණ්ඩය<br><br>**ජ්‍යෙෂ්ඨ කළමනාකරු** - (PS 4) - (රසායනික හා අපජල පිරිපහදුව)<br>A කාණ්ඩය<br><br>**ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක** -PS 4 | 01<br><br>01<br><br>01 | (1) අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ උපාධියට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් හෝ ආශ්‍රිත සාමාජිකත්වය/අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් සමඟ සුදුසුකම් ලබාගැනීමෙන් අනතුරුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද.<br><br>2) රජයේ දීප ව්‍යාප්ත සේවාවක III/II හෝ ඊට ඉහළ පන්තියක නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්ත්වයක් සහ III/II පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.<br><br>***- සමාන ක්ෂේත්‍රයක පළපුරුද්ද ඇති අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.*** |
| **සහකාර ඉංජිනේරු**<br>- PS 5 -<br>(විදුලි) | 01 | (1) අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ උපාධියට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් හෝ ආශ්‍රිත සාමාජිකත්වය/අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් හෝ තාක්ෂණික ක්ෂේත්‍රයකට අදාළ තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් සහ අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද.<br><br>(2) තාක්ෂණික ක්ෂේත්‍රයකට අදාළ තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් සහ අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.<br><br>3) තාක්ෂණික ක්ෂේත්‍රයකට අදාළ තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් සහ අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.<br><br>***- සමාන ක්ෂේත්‍රයක පළපුරුද්ද ඇති අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.*** |

ඉහත තනතුරු සඳහා වැටුප් සහ ප්‍රතිලාභ 2019.03.15 දිනැති අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට සමාන වේ. අයදුම්කරුවන් විසින් අයදුම් කිරීමේ අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, ජීව දත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් වල සහතික කළ පිටපත් සහ අයදුම්කරු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කල හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ විස්තර සහිතව 2023.07.22 හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. **අයදුම්පත්‍රය බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සහ ව්‍යාපෘතිය පැහැදිලිව**

**සඳහන් කළ යුතුය**. තනතුරට අදාළ සුදුසුකම් සපුරා ඇති කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා යොමු කළ යුතුය.

අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :

**ලේකම්,**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**
**17 වන මහල**
**"සුහුරුපාය"**
**බත්තරමුල්ල.**